www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද්ධය ඉන්දියාව සමග ආතතීන් උත්සන්න කරයි

## War in Sri Lanka heightens tensions with India

**විජේ ඩයස් විසිනි**
**2008 නොවැම්බර් 10**

ශ්‍රී ලංකාවේ දැන් පවත්නා සිවිල් යුද්ධය කොලඹ සහ නව දිල්ලිය අතර සබඳතා අවුල් කරමින් සිටින්නේ ආතතීන් සමනය කර ගැනීමට දෙපාර්ශ්වය ම විසින් ගනු ලබන ප්‍රයත්නයන් ද නොතකා ය. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි ශ්‍රී ලංකාවේ මිලිටරියේ ජයග්‍රහන, 200,000ක් වන යුද සරනගතයන්ගේ ඉරනම පිලිබඳව දකුනු ඉන්දියාව තුල විරෝධතා අවුලුවාලීමට පමනක් නොව, එල්ටීටීඊයේ පරාජයක ඇගවුම් පිලිබඳව ඉන්දියානු සංස්ථාපිතය තුල වැඩෙන උත්සුකතාවන්ට ද හේතු වී තිබේ.

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ ඉන්දියානු නායකයන් හමුවනු පිනිස ඔක්තෝබර් 26 දා සිය සොහොයුරු බැසිල් රාජපක්ෂ නව දිල්ලියට යැවී ය. මෙම සංචාරය සඳහා ක්ෂනික ගාමකය වූයේ, ඉන්දියානු ආන්ඩුව යුද්ධය නතර කරන ලෙස ශ්‍රී ලංකාවට බල නොකල හොත් තමන් ජාතික පාර්ලිමේන්තුවෙන් ඉවත් වන බවට දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ දේශපාලන පක්ෂ කල තර්ජනයකි. තමිල්නාඩුවේ පක්ෂ ගනනාවක් ම පාලක සභාගයේ කොටස්කරුවන් වන නිසා එවන් පියවරක් කොංග්‍රස් නායකත්වයෙන් යුත් ආන්ඩුවට වල කැපීමට ඉඩ තිබේ. මෙම තර්ජනය, ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කැඳවා යුද සරනගතයන් පිලිබඳ සිය "ගැඹුරු උත්සුකතාව" ප්‍රකාශ කිරීමට ඉන්දියානු නිලධාරින් පොලඹවාලී ය.

බැසිල් රාජපක්ෂ ඉන්දියානු විදේශ කටයුතු ඇමති ප්‍රනාබ් මුඛර්ජී මුන ගැසුනු අතර දෙදෙනා ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කලේ ය. "දැඩි අධිෂ්ඨානයකින් යුක්තව ත්‍රස්තවාදයට මුහුන දිය යුතු බවට දෙපාර්ශ්වය එකග වූ" බව එය සඳහන් කලේ, "උතුර ඇතුලු දිවයින තුල සාමකාමී ලෙස සාකච්ඡා කෙරුනු දේශපාලන විසඳුමක් දෙසට පියවර ගැනීමේ අවශ්‍යතාව ද දෙපාර්ශ්වය සාකච්ඡා කල" බව ප්‍රකාශ කරමිනි. "ශ්‍රී ලංකාවේ දෙමල ප්‍රජාවේ ආරක්ෂාව සහ යහ පැවැත්ම ගැන වග බලා ගන්නා" බව රාජපක්ෂ මුඛර්ජීට සහතික වූ අතර ශ්‍රී ලංකාවේ උතුරට ටොන් 800ක සහන සැපයුම් එවන බව ඉන්දියාව නිවේදනය කලේ ය.

එහි රාජ්‍යතාන්ත්‍රික භාෂාව ඉවත් කල විට, ප්‍රකාශය යුද සරනගතයන්ගේ ඉරනම පිලිබඳ ඉන්දියාවේ උත්සුකතා ගැන කටින් බතල කොල හිටවන ගමන් "ත්‍රස්තවාදී" එල්ටීටීඊයට එරෙහි සිය මිලිටරි ආක්‍රමනික මෙහෙයුම් දිගට ම ගෙන යාම සඳහා ශ්‍රී ලංකා ආන්ඩුවට කොල එලිය ලබා දුන්නේ ය. "දේශපාලන විසඳුමක්" පිලිබඳ සැඳහුම් තිබුනත්, 2002 සටන් විරාමය ද ජාත්‍යන්තර අනුග්‍රාහකත්වයෙන් එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීම ද කරා ආපසු යාමක් පිලිබඳ කිසිදු යෝජනාවක් එහි නොවීය. 2006 මැද දී ජනාධිපති රාජපක්ෂ සටන් විරාමය විවෘතව උල්ලංඝනය කරමින් මිලිටරි ආක්‍රමනික මෙහෙයුම් මාලාවක් ම දියත් කල අතර, පසුව අවසානයේ මේ වසරේ ජනවාරියේ දී එය ඉරා දැමී ය.

හමුවෙන් පසුව, සිය ඉල්ලා අස්වීමේ තර්ජනය ඉවත් කර ගන්නා ලෙස මහ ඇමති එම්. කරුනානිධිට ඒත්තු ගන්වනු පිනිස මුඛර්ජී වහාම තමිල්නාඩුව කරා ගියේ ය. කරුනානිධි වහාම එයට එකග වූයේ, සිය ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් (ඩීඑම්කේ) පක්ෂයේ මවාපෑම් ශ්‍රී ලංකාවේ දෙමල ජනයා පිලිබඳ සැබෑ උත්සුකතා මගින් මෙහෙයවෙනවා නොව තමිල්නාඩුවේ යුද විරෝධී උද්ඝෝෂන ව්‍යාපාර සමනය කර ගැනීම එහි එල්ලය වන බව පැහැදිලි කරමිනි.

කරුනානිධිගේ තීන්දුව, ඩීඑම්කේහි සගයකු වන පට්ටාලි මක්කල් කච්චි (පීඑම්කේ) වෙතින් කෝපාවිෂ්ඨ ප්‍රතිචාරයක් අවුලුවාලී ය. ශ්‍රී ලංකාවේ යුද්ධය නතර කරනු පිනිස නව දිල්ලිය පොලඹවාලීමට අසමත් වූයේ යැයි පීඑම්කේ නිර්මාතෘ එස්. රාමඩොස් මහ ඇමතිව විවේචනය කලේ ය. කරුනානිධි වහාම සිය පියවර යුක්තියුක්ත කරමින් "ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත්වීමේ දී ඉන්දියාවට සීමාවන් පැවති" බව ප්‍රකාශ කල අතර කොංග්‍රස් නායකත්වයෙන් යුත් ආන්ඩුව වැට්ටීමේ ප්‍රතිවිපාක ගැන ද අනතුරු ඇගවී ය.

ක්ෂනික දේශපාලන අර්බුදය විසඳගෙන ඇති බවක් පෙනී ගියත් ශ්‍රී ලංකාවේ යුද්ධය කලින් නව දිල්ලිය ගෙන ගිය ප්‍රවේශම් සහගත සමබරතා ක්‍රියාවලිය

අර්බුදයට හෙලමින් තිබේ. එය ඉන්දියාව තුල බෙදුම්වාදී ව්‍යාපාර තව දුරටත් දිරිගන්වනු ඇතැයි භීතියෙන්, ශ්‍රී ලංකාවේ උතුරේ හා නැගෙනහිර වෙනම ඊලම් රාජ්‍යයක් පිලිබඳ එල්ටීටීඊයේ ඉල්ලීමට ඉන්දියානු ආන්ඩුව විරුද්ධ වී ඇත. ඒ සමග ම, තමිල්නාඩුවේ පොදු මහජන මනෝගතිය අස්වසනු පිනිස ශ්‍රී ලංකාවේ දෙමල සුලුතරයේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ගේ ආරක්ෂකයකු ලෙස මවාපෑමට ද නව දිල්ලියට සිදු වී තිබේ.

නොවැම්බර් 4 දා මිලිටරි අන දෙන නිලධාරීන්ගේ ත්‍රිත්ව-සේවා සම්මන්ත්‍රනයක් අමතමින් ඉන්දියානු අගමැති මන්මෝහන් සිං ඉන්දියාවේ ආස්ථානය සාරාංශගත කලේ ය. "ශ්‍රී ලාංකික දෙමල ජනයාගේ සුභසාධනය ඉන්දියාවේ උත්සුකතාවට නිරතුරුව ම ලක්වූ අතර ම . . . ශ්‍රී ලංකාවේ එක්සත්කමට හා භෞමික අඛන්ඩතාවට දිගට ම කැපවී ගැනීම ද එයට අවශ්‍ය විය" යයි ඔහු ප්‍රකාශ කලේ ය.

කෙසේ වෙතත්, යුද්ධය නව දිල්ලිය ඉදිරියේ දිගට ම උභතෝකෝටිකයක් මතු කරයි. තමිල්නාඩුවේ මහජන අසන්තෘප්තිය වලක්වනු පිනිස ඉන්දියාව ශ්‍රී ලංකාවට ලබා දෙන සිය මිලිටරි ආධාර "මාරාන්තික නොවන උපකරනවලට" සීමා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාව ආයුධ පිනිස ඉන්දියාවේ කලාපීය ප්‍රතිවාදීන් -- පකිස්ථානය සහ චීනය -- ඇතුලු වෙනත් රටවල් වෙත හැරී ඇත්තේ, දිවයින සිය බලපෑම් ක්ෂේත්‍රයේ කොටසක් ලෙස සලකන නව දිල්ලිය තුල උත්සුකතා අවුලුවාලමිනි.

විදේශ කටයුතු ඇමති මුඛර්ජී ඔක්තෝබර් අග දී ඉන්දියානු පාර්ලිමේන්තුවට මෙසේ පැවසීය:"අප (යුද සරගතයන් පිලිබඳ) උත්සුක වීමේ දී, අප අමතක නොකල යුතු වන්නේ එම දිවයිනේ මූලෝපායික වැදගත්කමයි. එය ඔවුන්ගේ ආරක්ෂාව පමනක් නොවේ. එය අපගේ ආරක්ෂාව සමග ද සමීපව බැඳී ඇත." යයි ඔහු පැවසුවේය. "නිසැකව ම අපගේ පිලිකන්න ජාත්‍යන්තර ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා පිටියක් වනු දැකීමට අපි කැමති නොවනු ඇත."

බැසිල් රාජපක්ෂ සමග පැවති සාකච්ඡා පිලිබඳව අදහස් දක්වමින්, මුඛර්ජී ඇඟවූයේ ඉන්දියාව ශ්‍රී ලංකා මිලිටරියට දෙන සිය සහයෝගය බොහෝ සෙයින් වර්ධනය කරනු ඇති බවටයි. "ඔබ වෙන අතක් (පකිස්ථානය හා චීනය) දෙස නොබලන තාක් කල් ඔවුන්ගේ ආරක්ෂක අවශ්‍යතා සපුරාලීම අපට කල හැකි යයි අපි ඔවුන්ට පැවසුවෙමු." යයි ඔහු පැවසීය. බුද්ධි තොරතුරු ද සුලු පරිමාන බෝම්බ ප්‍රහාර සඳහා එල්ටීටීඊය යොදා ගනිමින් සිටින සැහැල්ලු ගුවන් යානාවල ගමන් පථ සොයා ගැනීමේ ඉලක්කය ඇති නව රාඩාර් පද්ධති ද ශ්‍රී ලංකා මිලිටරියට සැපයීමේ ඉන්දියාව මේ වන විටත් නිහඬව යෙදී සිටී.

2006 ජුලි මස පටන්, ශ්‍රී ලංකාවේ මිලිටරිය දිවයිනේ නැගෙනහිර පැවති එල්ටීටීඊයේ බල මධ්‍යස්ථානවලින් එය පලවා හැර උතුරේ වන්නි කලාපයේ එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශ තුලට ද සැලකිය යුතු ලෙස කාවැදී තිබේ. මාස ගනනාවක දරුනු සටන්වලින් පසුව, හමුදාව එල්ටීටීඊයේ පරිපාලන හා මිලිටරි කේන්ද්‍රස්ථානය වන කිලිනොච්චියට එදිරිව ස්ථානගතව සිටී. එම නගරය අල්ලා ගැනීමක් එල්ටීටීඊයට එල්ල වන දේශපාලන ප්‍රහාරයක් වනවා පමනක් නොව, එහි මිලිටරි බලවේග බෙදීමේ ද තර්ජනය මතු කරයි.

සටනේ ප්‍රතිඵලය කිසිසේත්ම නිශ්චිත නැති මුත්, ඔවුන් හමුදාව මත ප්‍රධාන පරාජයන් මාලාවක් ම පැටවූ 2000 දීට වඩා විශාල, මැනවින් සන්නද්ධ ශ්‍රී ලංකා මිලිටරියකට එල්ටීටීඊය මුහුන දී සිටින බව ස්ථිර ය. එතැන් පටන්, ශ්‍රී ලංකා ආන්ඩුව, විශේෂයෙන් ම එක්සත් ජනපදයේ පිටුබලය ද සහිතව, එල්ටීටීඊය ජාත්‍යන්තරව හුදකලා කොට ඇත්තේ, අරමුදල් රැස් කිරීමේ හා අවි මිලට ගැනීමේ එහි හැකියාව සීමා කරමිනි.

කෙසේ වෙතත්, එල්ටීටීඊය හුදකලා කිරීම හෝ එය මිලිටරිමය ලෙස පරාජයට පත් කිරීම පවා, ගැටුම විසඳනවා නොව, ශ්‍රී ලංකාව තුල වාර්ගික ආතතීන් තව දුරටත් උත්සන්න කොට නව දිල්ලිය මුහුන දෙන දේශපාලන ගැටලු සංකීර්න කරනු ඇත. 25 වසරක සිවිල් යුද්ධය කිසිදාක "ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම" හෝ "ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම" පිනිස නොවී ය. එහි එල්ලය වන්නේ, දිවයිනේ සිංහල ප්‍රභූ කොටස්වල අධිපති ආර්ථික හා දේශපාලන තත්වය දෙමල සුලුතරය මත දැඩි ලෙෂ තහවුරු කිරීමයි. යුද්ධය ඇවිලවීමට තුඩු දුන් දෙමල ජනයාට එරෙහි ක්‍රමානුකූල වෙනස්කම් කිරීම්, රටේ රාජ්‍ය ආගම ලෙස බුද්ධාගම ස්ථාපිත කරන ව්‍යවස්ථාමය විධිවිධානය තුල සාරාංශ ගත වී පවතී.

"මුදාගත්" නැගෙනහිර පලාත තුල රාජපක්ෂ ආන්ඩුව පටවා ඇත්තේ, පැහැරගෙනයාම්, කප්පම් ගැනීම් හා ඝාතන පිලිබඳව කුප්‍රකට සන්නද්ධ කන්ඩායමක් වන තමිල් මක්කල් විඩුතලෙයි පුලිකල් (ටීඑම්වීපී) සංවිධානයේ නායකයා විසින් මෙහෙයවනු ලබන පලාත් පරිපාලනයක මූලිකත්වයෙන් යුක්ත මිලිටරි වාඩිලෑමකට සමාන පාලනයකි. එවන් පාලනයක් දිවයිනේ උතුර දක්වා ද දීර්ඝ කිරීම, ඉන්දියාවට ඇතුලු වන දෙමල සරනගතයන් රැල්ලක් නිර්මානය කරනු පමනක් නොව, ශ්‍රී ලංකාවේ දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පෑගීම සම්බන්ධයෙන් තමිල්නාඩුව තුල මහජන කෝපය යලිත් උත්සන්න කරනු ඇත.

නව දිල්ලියේ භීතියට හේතු වී ඇත්තේ, ශ්‍රී ලංකා මිලිටරිය එල්ටීටීඊයට එරෙහිව ලබන ජයග්‍රහනයක් ඉන්දියාව තුල අස්ථායිකාරක ප්‍රතිවිපාක ජනිත කරනු ඇත යන්නයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉන්දියානු ආන්ඩුව,

දෙමල සුලුතරයට සහන ලබා දෙන ලෙස ශ්‍රී ලංකා ආන්ඩුවට බල කිරීමේ විධික්‍රමයක් වසයෙන්, ගැටුමට “දේශපාලන විසඳුමක්” සඳහා වන සිය කැඳවුම මත වන අවධාරනය යලි අලුත් කරමින් සිටී.

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති රොබර්ට් බ්ලේක්, තමිල්නාඩුවේ මදුරාසි විශ්වවිද්‍යාලයේ කල මෑත කතාවක දී ඉන්දියාවට එක්තරා පිටුබලයක් සැපයීය. දිග්ගැසුනු ගරිල්ලා යුද්ධයක් දිගටම පවත්වා ගෙන යාමේ එල්ටීටීඊයේ හැකියාව හමුවෙහි ශ්‍රී ලංකා මිලිටරියේ සම්පූර්න මිලිටරි ජයග්‍රහනයක් “බෙහෙවින් ම අසීරු” වනු ඇතැයි ඔහු අවධාරනය කලේය. “එක්සත් ශ්‍රී ලංකාවක රාමුව ඇතුලත දේශපාලන විසඳුමක් පිලිගන්නා” ලෙස ශ්‍රී ලංකාවේ ආන්ඩුවෙන් ඉල්ලා සිටීමෙහි එක්සත් ජනපදය සහ මහ බලවතුන් දිගට ම යෙදී සිටින බව ඔහු ඇගවුම් කලේ ය.

වොෂිංටනයේ දේශපාලන සහයෝගය මත බොහෝ සෙයින් වාරු වන අතර ම, ජනාධිපති රාජපක්ෂ, එල්ටීටීඊයට එරෙහි මිලිටරි ජයග්‍රහනයක් මත සිය දේශපාලන අනාගතය පරදුවට තබා ඇත. යුද්ධය දිවයිනේ ආර්ථික අර්බුදය සංකීර්න කර ඇති තතු යටතේ, ආන්ඩුව සිංහල ස්වොත්තමවාදය අවුලුවා, සිය විවේචකයන් ද්‍රෝහීන් ලෙස හෙලා දැක, මොන යම් හෝ විරුද්ධත්වයක් නිහඬ කරනු පිනිස වඩ වඩා ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම යොදා ගෙන තිබේ. දෙමල සුලුතරයට ලබා දෙන මොන යම් හෝ ආන්ඩුවේ සහනයක් රාජපක්ෂ වාරු වී සිටින සිංහල අන්තවාදී සගයන් විරසක කරනු ඇත.

බැසිල් රාජපක්ෂගේ නව දිල්ලි සංචාරය, ශ්‍රී ලංකාව තුල ඉන්දියානු මැදිහත්වීමකට ඉඩකඩ සලසා ඇතැයි විවේචනයට ලක් කෙරුනි. ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ලේකම් ටිල්වින් සිල්වා ප්‍රවෘත්ති සාකච්ඡාවක දී මෙසේ පැවසීය. “තමිල්නාඩුවේ පවතින තත්වය නිර්මානය කර ඇත්තේ ඉන්දියාවේ මධ්‍යම ආන්ඩුවයි. ඒ ශ්‍රී ලංකාවේ ජාතික ගැටලුවට ඔවුන්ට මැදිහත්වීමට මාවත පාදා ගැනීමටයි. ඒ අතරෙ ශ්‍රී ලංකා ආන්ඩුව ඉන්දියානු පීඩනයට යටත් වෙලා.” ආකාරගත ලෙස විරුද්ධ පාර්ශ්වයේ සිටියත් ජවිපෙ රාජපක්ෂ ආන්ඩුවේ යලි ඇරඹූ යුද්ධයට, හදිසි නීති බලතලවලට හා දැවැන්ත මිලිටරි වියදම්වලට යලි යලිත් සහයෝගය දී තිබේ.

ආන්ඩුව සමග සමීප සබඳතා තනා ගනු පිනිස ජවිපෙන් භේද වූ ජාතික නිදහස් පෙරමුන (ජානිපෙ) ද ඊට සමාන ඝෝෂාබද්ධ ආස්ථානයක් ගෙන ඇත. ජානිපෙ නායක විමල් වීරවංශ පක්ෂ නායකයන්ගේ හදිසි රැ ස්වීමක් ඉල්ලා සිටියේ මෙසේ ප්‍රකාශ කරමිනිඃ “ඉන්දියාව මේ පැයේ මැදිහත් වනවා නම්, එය හුදෙක් එල්ටීටීඊය ගලවා ගැනීමේ උත්සාහයක් ම වනවා ඇති. . . . සමස්ත ජාතියම මේ ගැටලුවට අවධානය යොමු කල යුතුයි.”

මෙම ඉන්දියානු විරෝධී වාචාලත්වයට යථාර්ථය සමග සබඳතාවක් නැත. නව දිල්ලිය එල්ටීටීඊයට එරෙහි යුද්ධයට දේශපාලනිකව සහයෝගය දීමේ හා මිලිටරි ආධාර සැපයීමේ දිගටම යෙදී සිටී. එහෙත් ශ්‍රී ලංකා හමුදාවේ ඉදිරි ගමන සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන මානුෂ්‍ය ව්‍යසනය ඉන්දියානු ආන්ඩුවට පහසුවෙන් නොතකා හැරිය නොහැකි දේශපාලන ආතතීන් වර්ධනය කරයි.

© www.wsws.org